# 06 සසුන් කෙත සරු කළ, උතුමෝ ගුණැති පෙර කල

ලක්වැසියන් වන අප සතු ව ඇත්තේ අභිමානවත් දීර්ඝ ඉතිහාසයකි. එම ඉතිහාසය තුළ මෙරට පහළ වූ ශ්‍රේෂ්ඨ පැවිදි උතුමන් රාශියක් ගැන අපි අසා ඇත්තෙමු. උන් වහන්සේලා නොයෙක් ආකාරයෙන් නොමැකෙන මෙහෙවරක් ඉටු කළ නිසා ම කිසි කලෙකත් අපට අමතක කළ නොහැකි ය.

මේ අතර එබඳු මෙහෙවරක් අප වෙනුවෙන් ඉටු කළ ගිහි උතුමන් ගැන ද ඉතිහාසයේ සඳහන් වේ. නොයෙක් පැතිවලින් සිදු කර ඇති මහ මෙහෙවර නිසා ම එම ගිහි උතුමෝ ද අමරණීයත්වයට පත් ව සිටිති. එසේ රට දැය සමය වෙනුවෙන් මහත් කැපවීමකින් මහ මෙහෙවරක් කළ ශ්‍රේෂ්ඨ සංඝ පිතෘවරයෙකු හා නරපතියකු ගැන සාකච්ඡා කිරීම මෙම පාඩමෙහි අරමුණයි. පාසල් සිසුන් වන අපට එම උතුමන්ගේ ජීවන චරිත තුළින් ගත හැකි ආදර්ශ බොහෝ ය. අප එම චරිත නිරතුරු ව ම සිහිපත් කළ යුතු ය. එම උතුම් මග ම ගරු කළ යුතු ය.

## වැලිවිට අසරණ සරණ සිරි සරණංකර සංඝරාජ මාහිමිපාණන් වහන්සේ

මහනුවර යුගය (ව්‍ය.ව. 1480 - ව්‍ය.ව. 1815) ලක් ඉතිහාසයේ සුවිශේෂ සන්ධිස්ථානයකි. ඈත අනුරාධපුර යුගයෙන් ඇරඹෙන අපේ ලක් ඉතිහාසයේ යුග ගණනාවක් පසු කළ විට මෑත මහනුවර යුගය හමු වේ. එම යුගය තුළ විවිධ අර්බුද ඇති වූ බව ඓතිහාසික තොරතුරුවලින් අනාවරණය වේ. පෘතුගීසි, ලන්දේසි ආදී බටහිර ජාතීන් මුහුදුබඩ ප්‍රදේශ අල්ලා ගැනීම මේ අර්බුදවල එක් අවස්ථාවකි. කන්ද උඩරට රාජධානිය නායක්කර් වංශික අබෞද්ධ රජවරුන්ගේ පාලනයට යටත් වීමෙන් දාහත් වන සියවසේ මැද භාගය වන විට දේශීය බෞද්ධ සංස්කෘතිය ක්‍රමයෙන් පරිහානියට පත් වන්නට විය. ශාසනික පරිහානිය ද එහිලා කැපී පෙනුණි. එක් උපසම්පදා භික්ෂුවක් හෝ සොයා ගැනීම අසීරු විය. වැලිවිට සරණංකර සඟරජ හිමිපාණන් පහළ වූයේ මෙබඳු පරිහානි යුගයකයි.

උන් වහන්සේ උඩරට තුම්පනේ ප්‍රදේශයේ වැලිවිට නම් ගමේ ව්‍ය.ව. 1698 ජූනි 18 වැනිදා සැදැහැවත් හෙළ බොදු කුලයක උපත ලැබූහ. ඒ පින්වත් කුල කුමරුගේ ගිහි නම කුලතුංග බණ්ඩාරයි. වයස අවුරුදු 16 දී මහනුවර සූරියගොඩ විහාරයේ වැලිවිට සරණංකර නමින් පැවිදි බව ලැබූ මේ පින්වත් කුල කුමරුවා තුළ උපතින් ම බොහෝ වාසනා ගුණ ඇති බව ගුරු දෙගුරුන්ට පෙනී ගියේ ය.

ඇති වී තිබූ සංස්කෘතික පරිහානිය නිසා පොත්පත් මෙන් ම ගුරුවරුන් ද සොයා ගැනීම ඉතා ම දුෂ්කර වූ මේ යුගයේ සරණංකර හිමිපාණන් වහන්සේට අවශ්‍ය අධ්‍යාපනය ලබා ගැනීම ගැටලුවක් විය. උන් වහන්සේට සිදු වූයේ ගුරුවරුන් සොයා දුර බැහැර ප්‍රදේශවලට ගොස් බොහෝ දුෂ්කරතා මැද පාලි භාෂාව හා ධර්ම විනය ඉගෙනීමටයි. උත්සාහය හා කැපවීම අත් නොහළ සරණංකර හිමිපාණන් බොහෝ දේ උගත්තේ ස්වෝත්සාහයෙනි. සිංහල, පාලි, සංස්කෘත, බුද්ධ ධර්මය, කාව්‍ය ශාස්ත්‍රය හා තවත් බොහෝ විෂයයන් පිළිබඳ ව හසළ දැනුමක් ලබා ගැනීමට උන් වහන්සේට හැකි විය.

ශික්ෂාකාමී අල්පේච්ඡ ජීවිතයක් ගත කිරීමට කැමැති වූ වැලිවිට සරණංකර ස්වාමීන් වහන්සේ පැවිදි වූ දා සිට ම යැපුණේ පිඬුසිඟා වැඩීමෙන් ය. එබැවින් පිණ්ඩපාතික සරණංකර හිමි යනුවෙන් ද ගමින් ගමට වඩිමින් දහම් දෙසමින් අසරණයන්ට පිහිට වූ බැවින් අසරණ සරණ සරණංකර හිමි යන නමින් ද උන් වහන්සේ ප්‍රසිද්ධ වූහ. බුද්ධ ශාසනය මෙන් ම බෞද්ධ සමාජය ද මේ වන විට මුහුණ දී තිබූ කනගාටුදායක තත්ත්වය ශාසනමාමක බොහෝ දෙනාගේ අවධානයට ලක් වූවකි. භික්ෂූ නමින් පෙනී සිටි ඇතැම්හු අඹු දරුවන් පෝෂණය කළහ; ධනවත් රදල පවුල්වලට පණිවිඩ ගෙන යාම් ආදී මෙහෙවර ඉටු කළහ.



*කීර්ති ශ්‍රී රාජසිංහ රජතුමා විසින් වැලිවිට ශ්‍රී සරණංකර නාහිමියන්ට සංඝරාජ පදවිය පිරිනැමීම*

ඔවුහු ධර්ම විනය පිළිබඳ ව දැනුමෙන් මෙන් ම ශික්ෂණයෙන් ද පිරිහී සිටියෝ ය. උගත් භික්ෂූන් හා ගිහියන් සිටියේ අතලොස්සකි. ඔවුන් ද විටෙක චරිතයෙන් පිරිහී සිටි බව සඳහන් වේ. කලින් පැවති අධ්‍යාපන ආයතන අභාවයට ම ගොස් තිබිණ. උපසම්පදාවකට අවශ්‍ය භික්ෂූන් සොයා ගැනීමට නොහැකි තරමට ශාසනික තත්ත්වය පහත වැටී තිබුණි.

මේ කාලයේ දී සරණංකර මාහිමිපාණෝ මෙම පරිහානියෙන් සසුන නඟා සිටුවිය යුතු යැයි අධිෂ්ඨාන කර ශාසනමාමක පිරිස් සංවිධානය කර ගත්හ. ඒ අනුව **සිල්වත් සමාගම** නමින් සංවිධානයක් පිහිටුවා ගන්නා ලදී. දුසිල්වතුන්ගේ බාධක හිරිහැර මැද පා ගමනින් ගම් දනව් සිසාරා වඩිමින් ධර්මය දේශනා කරමින්, පැවිදි වීමට කැමැති බොහෝ පිරිසක් සිල්වත් සමාගමට එක් කර ගැනීමට අප හිමිපාණන්ට හැකි විය. එසේ ම සරණංකර මාහිමියෝ බොදු දරුවන්ගේ ශාසනමාමක බව ද දියුණු කිරීමට ක්‍රියා කළහ; ධර්මඥානය මෙන් ම වත් පිළිවෙත් ද ප්‍රගුණ කර සසුනේ චිර පැවැත්ම කැමැති භික්ෂූන් වහන්සේලා බිහි කිරීමට කටයුතු කළහ.

උපතින් වයස අවුරුදු පණහ ඉක්මවුව ද සරණංකර සාමණේර හිමිපාණන් වහන්සේට උපසම්පදාව ලබා ගත නොහැකි විය. ඊට හේතුව උපසම්පන්න භික්ෂූන් එකල මෙරට නොසිටීමයි. සරණංකර හිමිපාණෝ කීර්ති ශ්‍රී රාජසිංහ රජතුමාගේ උදවු ඇතිව උපසම්පදා භික්ෂූන් වහන්සේලා පිරිසක් මෙරටට වැඩම කර ගැනීම සඳහා දූත පිරිසක් සියම් (තායිලන්තය) රටට යැවීමට කටයුතු කළහ. සියම් රජතෙමේ උපාලි මහ තෙරුන් වහන්සේ ප්‍රමුඛ උපසම්පදාලාභී භික්ෂූන් වහන්සේලා විසි නමක් ලක්දිවට එවී ය. ව්‍ය.ව. 1753 දී සියම් රටින් පැමිණි මේ භික්ෂූන් වහන්සේ වෙතින් සරණංකර මාහිමිපාණන් ඇතුළු හය නමක් උපසම්පදාව ලබා ගැනීමෙන් ලක්දිව ශාසනික පුනරුදයක් ඇති විය. එහි දී සරණංකර මාහිමියන් වහන්සේ මුලින් ම උපසම්පදාව ලබා නොගෙන සිල්වත් සමාගමේ අනෙක් සිල්වතුන්ට මුල්තැන දුන් බව සඳහන් වේ. ඒ උන් වහන්සේ තුළ පැවති අනතිමානි ගුණය නිසා ය. සියම් මහා නිකාය නමින් හැඳින්වෙන භික්ෂු පරපුර ශ්‍රී ලංකාවේ ඇති වූයේ මෙම උපසම්පදාවෙන් පසු ව ය. උගත්කමින් හා ශික්ෂාකාමිත්වයෙන් අගතැන්පත් සරණංකර ස්වාමීන් වහන්සේ විසින් ලක්දිව බුදු සසුන නඟා සිටුවීමට කරන ලද සුවිශාල මෙහෙවරට උපහාර වශයෙන් කීර්ති ශ්‍රී රාජසිංහ රජතුමා විසින් සඟරජ පදවිය පිරිනමන ලදී. එහෙත් එම පදවිය නිසා උන් වහන්සේ උද්දාමයට පත් වූයේ නැත. සිය ආරාමයට වැඩි වහා ම තල් පතක් ගෙන තමාට ම අවවාද වශයෙන් **උඩඟු නොව මහණ** යන වචන තුන ලියා පිවිසුම් දොරටුවෙහි අලවා තැබූහ.

උඩුනුවර නියම කන්දේ පිරිවෙනක් පිහිටුවීමෙන් හා අනුරාධපුර, දඹුල්ල, පොලොන්නරුව ආදී බෞද්ධ සිද්ධස්ථාන ප්‍රතිසංස්කරණය කරවා නිසි පරිදි පුද පූජා පැවැත්වීමට උන් වහන්සේ කටයුතු කළහ. මෙසේ බෞද්ධ පුනර්ජීවනය සඳහා විශාල මෙහෙවරක් වැලිවිට සරණංකර සංඝරාජ මාහිමිපාණන් විසින් ඉටු කරන ලදි. මහනුවර පැවැත්වූ දේවාල පෙරහැරට ශ්‍රී දන්ත ධාතූන් වහන්සේට උපහාර දැක්වීමේ මාළිගාවේ මහ පෙරහැර ද එක් කරන ලද්දේ උන් වහන්සේගේ උපදෙස් අනුව ය.

ධර්ම විනය පිළිබඳ විශාරදයකු වූ වැලිවිට අසරණ සරණ සිරි සරණංකර සංඝරාජයාණන් වහන්සේ විසින් රචිත ධර්ම ශාස්ත්‍රීය ග්‍රන්ථ රැසකි.

1. මුණිගුණාලංකාරය
2. සාරාර්ථ සංග්‍රහය
3. රතනත්‍රය ප්‍රණාම ගාථා සන්නය
4. සතර බණවර සන්නය   ඒවායින් කිහිපයකි.

අවුරුදු අසූවක් ලෝක ශාසන සේවයේ යෙදුණු උන් වහන්සේ ව්‍ය.ව. 1778 ඇසළ පුර පසළොස්වක පොහෝ දින අපවත් වී වදාළහ. මෙසේ මෙරට ගිහි පැවිදි බෞද්ධ ජනතාව වෙනුවෙන් මෑත යුගයේ අසමසම මෙහෙවරක් ඉටු කරමින් පරිහානියට පත් සම්බුද්ධ ශාසනය නැවත ප්‍රතිෂ්ඨාපනය කිරීමට වැලිවිට අසරණ සරණ සිරි සරණංකර සංඝරාජ මාහිමියන් වහන්සේ ක්‍රියා කළහ. උන් වහන්සේගේ චරිතයෙන් අපට ලබා ගත හැකි ආදර්ශ කීපයක් මෙසේ ය.

- ත්‍රිවිධ රත්නය පිළිබඳ ව අපරිමිත ශ්‍රද්ධාවෙන් යුක්ත වීම
- ශික්ෂාකාමී ව හා අල්පේච්ඡ ව ජීවත් වීම
- විවිධ දුෂ්කරතා මැද වුවද අධ්‍යාපනය පිළිබඳ දැඩි ඇල්මක් දැක්වීම
- සිසු දරුවන්ට උදවු කිරීමට තිබූ කැමැත්ත
- නිරහංකාර බව
- ස්ථිර අධිෂ්ඨානය

## දුටුගැමුණු මහ රජතුමා

**"මාගේ මේ ව්‍යායාමය බුද්ධ ශාසනයේ චිරස්ථිතිය පිණිස මිස කිසි කලෙකත් රජ සැප පිණිස නොවන්නේ ය."** යනු දුටුගැමුණු රජතුමාගේ අභීත සටන් පාඨයයි. එහි පරමාර්ථය වූයේ දශක ගණනාවක සිට විනාශ මුඛයට යමින් පැවැති දේශීය ස්වාධීනත්වය ආරක්ෂා කර ගනිමින් විදේශ පාලනයෙන් රට, ජාතිය, ආගම මුදා ගැනීමයි. විදේශීය පාලනයෙන් රට මුදා ගෙන එක්සේසත් කිරීම නිසා එතුමා ඓතිහාසික යුග පුරුෂයෙකු වූ බව ප්‍රකට ය. එසේ ම එතුමන් විසින් සම්බුද්ධ ශාසනයේ චිරස්ථිතියත් සංවර්ධනයත් උදෙසා දැවැන්ත මෙහෙවරක් ඉමහත් ශ්‍රද්ධාවෙන් හා ඕනෑකමින් ඉටු කරන ලදි. එතුමා රුහුණු රජ පෙළපතට අයත් කාවන්තිස්ස රජතුමාගේ හා විහාර මහා දේවියගේ වැඩිමහල් පුත්‍රයා ය. හෙතෙම තම බාල සොහොයුරු තිස්ස කුමරු සමග දෙමාපියන්ගේ මග පෙන්වීම යටතේ මහා සංඝරත්නයේ අවවාද  අනුශාසනා ලබා හැදී වැඩුණේ ය.

මේ වකවානුවේ අනුරාධපුරය අගනගරය කොට ලක්දිව පාලනය කළේ එළාර නම් ද්‍රවිඩ රජ කෙනෙකි. මහාවංශයේ සඳහන් පරිදි එළාර රජු සාධාරණ දැහැමි පාලකයෙකි. ඔහුට පෙර මෙරට බලය අල්ලාගෙන සිටියේ සේන, ගුත්තික යන දකුණු ඉන්දියානු ආක්‍රමණිකයන් ය. මේ අවාසනාවන්ත තත්ත්වයෙන් රට බේරා ගෙන බුදු සසුන ආරක්ෂා කිරීම යුගයේ අවශ්‍යතාවක් වූයේ ය.

විදේශ බලවේග හමුවේ සටන් කොට රට දැය සමය බේරා ගැනීමට ගැමුණු කුමරු ඉමහත් කැපවීමෙන් හා උනන්දුවෙන් ක්‍රියා කළේ ය. කුමරුගේ මේ අපේක්ෂාවන්ට පිය රජතුමා මුලින් අකැමැති වූයේ ඒ සඳහා සුදුසු කාලය නොවන බව ප්‍රකාශ කරමිනි. පියතුමාගේ එකඟ නොවීම නිවටකමකැයි ගැමුණු කුමරා සිතුවේ ය. මේ පිය පුතු ගැටුමෙහි ප්‍රතිඵලයක් ලෙස ගැමුණු කුමරු කාලයක් පියාගෙන් ඈත් ව කොත්මලේ ප්‍රදේශයෙහි විසුවේ ය.

පිය රජුගේ අභාවයෙන් පසු රුහුණේ පාලකයා වූ දුටුගැමුණු කුමරුවාණෝ තම මවගේ ද, භික්ෂූන් වහන්සේගේ ද ආශීර්වාද ලබා සේනා සන්නද්ධ ව ගොස් ප්‍රාදේශීය නායකයන් පරාජය කරමින් ක්‍රමයෙන් අනුරාධපුරයට සමීප වූහ. විජිතපුර නම් ස්ථානයේ දී කරන ලද තීරණාත්මක සටනෙන් ජය ගත් දුටුගැමුණු කුමරුවාණෝ ත්‍රිසිංහලය එක් සේසත් කොට රජු බවට පත් වූහ. හෙතෙම සටනෙහි දී මිය ගිය එළාර රජු රාජකීය ගෞරව සහිත ව ආදාහනය කොට සෑයක් ද තනවා නිශ්ශබ්දතාව දක්වා එයට ගරු කරන ලෙස ජනතාවගෙන් ඉල්ලා සිටියේ ය. යුද්ධයේ දී ප්‍රතිවාදියෙකු වූ මොහුට කරන ලද මෙම ගෞරවය විශිෂ්ඨ ආදර්ශයකි.

මෙතුමාගේ ප්‍රධානතම ශාසනික මෙහෙවර වූයේ බෞද්ධ ලෝකයේ මුදුන් මල්කඩක් බඳු රුවන්වැලිසෑය ඉදි කිරීම ය. **මහාසෑය** යනුවෙන් හැඳින්වෙන එම සුවිසල් චෛත්‍යයට මුල් ගල තැබීමේ මංගල අවස්ථාව සඳහා ලෝකයේ නන්දෙසින් රහතන් වහන්සේලා දසදහස් ගණනක් වැඩිය බව සඳහන් වේ. ඉන් පැහැදිලි වනුයේ සමස්ත බෞද්ධ ලෝකයට ම මේ සිද්ධිය වැදගත් වූ බව ය. මේ දාගැබ ගොඩනැගීමේ යෙදුණු සියලු ම කාර්මිකයන්ට ආහාරපාන, ඇඳුම් පැළඳුම්, වැටුප් පිරිනැමූ බව මහාවංශයේ සඳහන් වේ. මහා සංඝරත්නය කෙරෙහි අතිමහත් ගෞරවයකින් යුක්ත ව හැදුණු වැඩුණු රජු කිසි විටෙක භික්ෂූන් වහන්සේලාට නොපිළිගන්වා ආහාර නොගත් බව සඳහන් වේ. මිරිස් ව්‍යංජනයක් සඟරුවනට පූජා නොකර ආහාරයට ගැනීම ගැන තමාට ම දඬුවම් දෙනු පිණිස රජතුමා සෑදවූ චෛත්‍යය මිරිසවැටිය නම් වේ. මීට අමතර ව තවත් වෙහෙර විහාර හැට අටක් දිවයිනේ විවිධ ප්‍රදේශවල කර වූ බව සඳහන් වෙයි.

දුටුගැමුණු රජුගේ අනුස්මරණීය ශාසනික ඉදිකිරීම් අතර **ලෝවාමහා ප්‍රාසාදය** යනුවෙන් හැඳින්වෙන අසිරිමත් ගොඩනැගිල්ල මහා සෑයට පමණක් දෙවෙනි වන්නකි. අනුරාධපුර මහමෙවුනා උයනෙහි මිහිඳු මාහිමියන් දවස දේවානම් පියතිස්ස මහ රජතුමාගෙන් ඇරඹුණු මහා විහාරය වඩාත් අංග සම්පූර්ණ ලෙස විවිධ ගොඩනැගිලිවලින් යුක්ත ව දැකුම්කලු සුවිසල් බෞද්ධ මධ්‍යස්ථානයක් බවට පත් කරන ලද්දේ ද මෙම රජතුමන් විසිනි.

රජතුමා ධර්ම ශ්‍රවණයට දැඩි කැමැත්තක් දැක්වී ය. එබැවින් සෑම ගමක ම ධර්ම දේශකයන් වහන්සේලා ලවා ධර්ම දේශනා පැවැත්වීමට සලස්වා උන් වහන්සේලාට ධර්ම පූජා සිදු කිරීමට ද කටයුතු සැලසී ය. එතුමා රාජ්‍යය කළ සූවිසි අවුරුද්ද තුළ වෙසක් උත්සව විසි හතරක් පැවැත් වූ බව මහා වංශයේ සඳහන් වේ. ආරෝග්‍යශාලා පිහිටුවා ගිලන්හල් සේවාවක් ආරම්භ කිරීම ද දුටුගැමුණු රජතුමාගේ තවත් මෙහෙවරකි. **තමා විසින් කරන ලද සියලු යහපත් ක්‍රියා සිය පින් පොතෙහි** සටහන් කිරීමට එතුමා අමතක නොකළේ ය. එබඳු පුණ්‍ය ක්‍රියා අතර පිරිස් බලයෙන් තොර ව හුදකලාව සිටි අවස්ථාවක තමන් සතු ව

තිබුණු එක ම ආහාර වේල භික්ෂූන් වහන්සේලාට පූජා කිරීම විශේෂයෙන් සඳහන් කළ හැකි ය.


මෙසේ ලෝ සසුන් කෙරෙහි අනුපමේය සේවයක් කළ රජතෙමේ හදිසියේ රෝගාතුර විය. ඒ වන විටත් නිම නොවූ රුවන්වැලි දාගැබේ කටයුතු සම්පූර්ණ කිරීමට සොහොයුරු සද්ධාතිස්ස රජතුමාට පවරන ලදි. එතුමා කොත්කැරැල්ල හුණදඬුවලින් සාදා සුදු රෙදිවලින් ආවරණය කොට චෛත්‍යයේ වැඩ අවසන් වූ ලෙසට, මරණ මඤ්චකයේ හුන් දුටුගැමුණු රජතුමාට පෙන්වීය. ස්වකීය පින් පොතට සවන් දෙමින් රුවන්වැලිසෑය දෙස සතුටින් බලා සිටිය දී කාලක්‍රියා කළ දුටුගැමුණු රජතුමාගේ නාමය ශ්‍රී ලංකා බෞද්ධ ඉතිහාසයේ රන් අකුරින් ලියැවී ඇත්තේ ය.

## සාරාංශය

වැලිවිට අසරණ සරණ සිරි සරණංකර සංඝරාජ මාහිමිපාණෝ ලක්දිව ශාසනික, සාමාජික අධ්‍යාපන හා ශාස්ත්‍රීය දියුණුවට විශාල සේවයක් කළ ශ්‍රේෂ්ඨ සංඝ පිතෘවරයෙක් වූහ. උන්වහන්සේ විදේශීය ආක්‍රමණ නිසා, විනාශ වී ගිය බුදු සසුන ප්‍රතිෂ්ඨාපනය කිරීමෙහි ලා පුරෝගාමී ව ක්‍රියා කළහ. සිල්වත් සමාගම පිහිටුවීම, උපසම්පදාව යළි ආරම්භ කිරීම, බෞද්ධ සිද්ධස්ථාන ප්‍රතිසංස්කරණය කිරීම මෙන් ම වටිනා ධර්ම ග්‍රන්ථ රචනා කිරීම තුළින් උන් වහන්සේ බුදු සසුනේ චිර පැවැත්ම සඳහා විශාල සේවයක් කළහ.

දුටුගැමුණු රජතුමා විදේශීය ආක්‍රමණිකයන්ගෙන් රට ජාතිය බේරා බුදු සසුන නොයෙක් අයුරින් නගා සිටවූ ශ්‍රේෂ්ඨ පාලකයෙකි. රුවන්වැලි සෑය, ලෝවාමහාපාය හා මිරිසවැටිය නිර්මාණය කිරීම ද මහා විහාර සංවර්ධනය ද රජතුමාගේ ශාසනික කාර්යයන් අතර ප්‍රධාන වෙයි. "මාගේ මේ ව්‍යායාමය බුද්ධ ශාසනයේ චිරස්ථිතිය පිණිස මිස කිසි කලෙකත් රජ සැප පිණිස නොවන්නේ ය." යන ප්‍රකාශයෙන් යුද වැදීමේ පරමාර්ථය ජනතාවට පැහැදිලි කළේ ය.

## ක්‍රියාකාරකම



1) වැලිවිට අසරණ සරණ සිරි සරණංකර සංඝරාජ මාහිමිපාණන් වහන්සේ ශාසනික දියුණුව උදෙසා සිදුකළ කාර්යයන් පිළිබඳ ලැයිස්තුවක් සකස් කරන්න.

2) වැලිවිට අසරණ සරණ සිරි සරණංකර සංඝරාජ මාහිමිපාණන් වහන්සේගේ හා දුටුගැමුණු රජුගේ චරිතයෙන් ඔබේ ජීවිතයට ගත හැකි ආදර්ශ දෙක බැගින් ලියන්න.

## පැවරුම



වෙනත් පැවිදි උතුමෙකුගේ හා ගිහි උතුමෙකුගේ චරිත කථා දෙකක් වැඩිහිටියන්ගෙන් අසා ලියා තබන්න.